# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2331/67 - 2023 මැයි මස 13 වැනි සෙනසුරාදා - 2023.05.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ජාතික සත්වෝද්‍යාන පනත

1982 අංක 41 දරන ජාතික සත්වෝද්‍යාන පනතේ 13 වන වගන්තිය යටතේ අමාත්‍යවරයාට පැවරී ඇති බලතල ප්‍රකාරව ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ, සත්ත්ව උද්‍යානවල සිටින සතුන් සඳහා ආහාර ලබා දීම, සතුන් සමග ඡායාරූප ගැනීම හා අභ්‍යන්තර ප්‍රවාහන පහසුකම් සැපයීම සඳහා අයකරන ගාස්තු 2023.05.02 දින සිට පහත දක්වා ඇති පරිදි නියම කරමි.

නීතිඥ පවිත්‍රා වන්නිආරච්චි,
වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍ය.

2023 මැයි මස 02 වන දින.

නියෝග

2023.05.02 දින සිට ක්‍රියාත්මක වන පරිදි ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව යටතේ ඇති දෙහිවල සත්වෝද්‍යානය, පින්නවල අලි අනාථාගාරය, පින්නවල සත්වෝද්‍යානය හා රිදියගම සෆාරි උද්‍යානය යන සත්වෝද්‍යාන නැරඹීම සඳහා පැමිණෙන දේශීය විදේශීය නරඹන්නන්ගෙන් සත්වෝද්‍යානවල සතුන් සඳහා ආහාර ලබා දීම, සතුන් සමග ඡායාරූප ගැනීම හා අභ්‍යන්තර ප්‍රවාහන පහසුකම් ඇති කිරීම සඳහා පහත පරිදි ගාස්තු අය කරනු ලැබේ.

**සතුන් සඳහා ආහාර ලබා දීම**

| *අනු අංකය* | *ප්‍රවේශ පත්‍ර වර්ගය* | *ක්‍රියාත්මක කරන ආයතනය* | *ගාස්තුව (රුපියල්)* |
|---|---|---|---|
| 01 | මාංශ භක්ෂක සතුන් සඳහා ආහාර ලබා දීම | සියලුම සත්වෝද්‍යාන සඳහා | රු. 200.00 |


1A - G 39490 — 07 (2023/05)


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**සතුන් සමග ඡායාරූප ගැනීම**

| *අනු අංකය* | *ප්‍රවේශ පත්‍ර වර්ගය* | *ක්‍රියාත්මක කරන ආයතනය* | *ගාස්තුව (රුපියල්)* |
|---|---|---|---|
| 01 | ඇනකොන්ඩා සමග ඡායාරූප ගැනීම | දෙහිවල සත්වෝද්‍යානය | රු. 500.00 |

**අභ්‍යන්තර බස් සේවාව**

| *අනු අංකය* | *ප්‍රවේශ පත්‍ර වර්ගය* | *ක්‍රියාත්මක කරන ආයතනය* | *ගාස්තුව (රුපියල්)* |
|---|---|---|---|
| 01 | වායුසමනය කරන ලද බස්රථ | රිදියගම සෆාරි උද්‍යානය | රු. 150.00 |
| 02 | වායුසමනය නොකරන ලද බස්රථ | රිදියගම සෆාරි උද්‍යානය | රු. 100.00 |

**නීතිඥ පවිත්‍රා වන්නිආරච්චි,**
වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍ය.

2023 මැයි මස 02 වන දින.
බත්තරමුල්ලේ දී ය.

EOG 05 - 0104

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.